**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**
**කොළඹ**

**<u>පුවත්පත් නිවේදනය</u>**

**ඉන්දීය මහ කොමසාරිස්තුමා ශ්‍රී දළදා මාළිගාව වැඳ පුදා ගනී: මල්වතු සහ අස්ගිරි මහ නායක හිමිවරුද බැහැ දකී**

2019 මැයි 17 වන දින ඉන්දීය මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා ශ්‍රී දළදා මාළිගාව වැඳ පුදාගත් අතර මල්වතු පාර්ශවයේ මහ නායක අති පූජ්‍ය තිබ්බොටුවාවේ ශ්‍රී සුමංගල හිමිපාණන් සහ අස්ගිරි පාර්ශවයේ මහ නායක අති පූජ්‍ය වරකාගොඩ ශ්‍රී ඥානරතන හිමිපාණන් බැහැදැක උන්වහන්සේලාගේ ආශිර්වාදයද ලබා ගත්තේය.

මහ නායක හිමිවරුන් සමග පැවති හමුවේදී මහ කොමසාරිස්තුමා වෙසක් මංගල්‍යය වෙනුවෙන් සිය සුභාශිංසන පිරිනැමූ අතර 2017 වසරේදී ශ්‍රී ලංකාවේ පැවති ජාත්‍යන්තර වෙසක් දින සැමරුම සඳහා අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා ශ්‍රී ලංකාවට සපැමිණි බවද සිහිපත් කළේය. එසේම 2018 වර්ෂයේදී සැදැහැවතුන්ට ශ්‍රී ලංකාවේදී සාරානාත් ධාතූන් වහන්සේලා වැඳ පුදා ගැනීමේ අවස්ථාව හිමි වූ බවද එතුමා සිහිපත් කළේය.

මහ කොමසාරිස්තුමා පවතින ආරක්ෂක තත්වය පිළිබඳවද මහ නාහිමිවරුන් සමග සාකච්ඡා කළ අතර ජිහාද් ත්‍රස්තවාදය නමැති පොදු තර්ජනයට මුහුණ දීම සඳහා ඉන්දියාව ශ්‍රී ලංකාවට පූර්ණ සහයෝගය ලබා දෙන බවටද සහතික විය.

මෙහිදී මහ නායක හිමිවරු දෙනම ඉන්දියාව ආරක්ෂක ක්ෂේත්‍රයද ඇතුළුව ශ්‍රී ලංකාවට ලබාදෙන කොන්දේසි විරහිත ශක්තිමත් සහයෝගය ඉතා අගය කළෝය.

මහ කොමසාරිස්තුමා, ඉන්දීය රජයෙන් ලබාදෙන රුපියල් මිලියන 150 ක මූල්‍යාධාරයක් යටතේ මහනුවර , පල්ලේකැලේ පිහිටි ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ආයතන පරිශ්‍රයේ ඉදිවෙමින් පවතින උඩරට නර්තන පාසලෙහි ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය o නිරීක්ෂණය කළේය.

කොළඹ

2019 මැයි 17